# ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

# කාර්යසාධන වාර්තාව - 2010

# හැඳින්වීම

## පසුබිම

වන සතුන් කළමණාකරණය කිරීම සහ සංරක්ෂණය කිරීමටත් සත්ව එකතුවක් වශයෙන් මහජනයාට ප්‍රදර්ශණය කිරීමත් විසිවන සියවසේ පෙර භාගයේදී ආරම්භ කරන ලද මූලික ආයතනයකි ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව.

යුරෝපයේ සත්වෝද්‍යාන වලට වන සතුන් අල්ලා සත්ව එකතුවක් රැස්කර තබාගැනීම සඳහා වර්ෂ 1936 දී රජය විසින් මූලික වශයෙන් එය ස්ථාපිත කරන ලදී. 1946 වන විට එය ස්වාධීන ආයතනයක් විය. මහජන කුතුහලය තෘප්තිමත් කිරීම සඳහාත් මහජන රසාස්වාදයට වඩා සත්ව සංරක්ෂණය සඳහාත් මෙහි මූලික අරමුණ විය.

ලෝක සත්වෝද්‍යාන සංකල්ප වෙනස් වීමත් සමඟ ශ්‍රී ලංකා සත්වෝද්‍යානයත් සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක යන විවිධ පැති තුළින් ආරක්ෂිත අරමුණු දෙසට වැඩි දියුණු විය. ආරක්ෂණ මධ්‍යස්ථානයක්, අල්ලාගත් සත්වයින් කළමණාකරණය කිරීම සහ විශේෂයෙන් තර්ජනයට ලක්වූ සත්ව විශේෂ සම්බන්ධයෙන් විශ්ව අරමුණු ඉටුකර ගැනීම සඳහා සත්වෝද්‍යානයකට වැදගත් කාර්යභාරයක් ඉටුකළ හැකිය.

වර්තමානය වන විට දෙහිවල සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, පින්නවල නව සත්වෝද්‍යානය, රිදියගම සෆාරි උද්‍යානය, ගෝනපොළ ගොවිපොළ සහ ගම්පහ දිස්ත්‍රික්කයේ නව මින්මැදුර ආදී වශයෙන් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව පුළුල් කර ඇත. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව ලෝකය පුරා හොඳින් දන්නා අතර වසරකට මිලියන 1,9 කට අධික නරඹන්නන් ප්‍රමාණයක් සහිතව රු. මිලියන 300කට අධික ආදායමක් උපයනු ලබයි.

මේ වන විට, ක්ෂීරපායි සත්ව විශේෂ 79 ක්, කුරුළු විශේෂ 89 ක්, උරග විශේෂ 31 ක්, මත්ස්‍ය විශේෂ 89 ක්, ක්ෂීරපායි පවුල් 03 ක් සහ සමනල විශේෂ 30ක් සඳහා දෙහිවල සත්වෝද්‍යානය නිවහන සපයනු ලබයි. සත්වයින් බෝවීම අනුව සත්වයින්ගේ මුලු ප්‍රමාණය 2500 - 3000 දක්වා වෙනස් වේ. දේශිය විදේහිය සත්වයින් සම්බන්ධයෙන් පමණක් නොව උභයජීවී සහ විශාල ගස් ප්‍රමාණයක් ඇති බැවින්ද දෙහිවල සත්වෝද්‍යානය ප්‍රසිද්ධියට පත්ව තිබේ.

පින්නවල අලි අනාථාගාරය 1975 දී අනාථ අලින් 05 දෙනෙකු සහිතව පින්නවල, රඹුක්කන අක්කර 25ක භූමි ප්‍රමාණයක් තුළ දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කරන ලදී. අලි ඇතුන් නිදහස් රංචුවක් ලෙස කළමණාකරණය කරන ප්‍රථම අලි අනාථාගාරය වශයෙන් අනන්‍යතාවයක් ඇති මෙය ජ්‍යාත්‍යන්තර සංචාරකයින් අතර ප්‍රසිද්ධියට පත්ව ඇති අතර සංචාරකයින්ට සංචාර කිරීමට ඉතා වැදගත් ස්ථානයකද වේ.. වර්තමානයේදී, සංරක්ෂණය සහ බෝකිරීමේ මධ්‍යස්ථානයක් වශයෙන් සහ අලි සහ ඔවුන්ගේ සංරක්ෂණය පිළිබඳ අවිධිමත් අධ්‍යාපනික ස්ථානයක් වශයෙන් අලි අනාථාගාරය සිය මෙහෙවර ඉටු කරනු ලබයි.

**මෙහෙය**

**සතුන් ආදරයෙන් රැකබලාගනිමින් සත්ව ප්‍රදර්ශනය කිරීම මඟින් සතුන් සම්බන්ධයෙන් අධ්‍යාපනයක් ලබාදෙමින් විචක්ෂණව සංරක්ෂණය කිරීම.**

නවීන සත්වෝද්‍යාන ප්‍රමිතීන් වලට අනුව සතුන් ලැඟුම් ගන්නා ස්ථාන සඳහා ප්‍රමාණවත් ඉඩක් ලබාදීමේ අවශ්‍යතාවයත් සමඟ දෙහිවල සත්වෝද්‍යානය පුළුල් කිරීමේ නොහැකියාව හේතුවෙන් අවශ්‍යතාවයන් ඉටුවන පරිදි පින්නවල නව සත්ව උද්‍යානය ඉදිකරමින් පවතී.

ශ්‍රී ලාංකිකයින්ට නව අත්දැකීමක් ලබාදීමට, දෙහිවල සත්වෝද්‍යානයේ වැඩිපුර සිටින සතුන්ගේ සුභසාධනය සහ කළමණාකරණය වැඩිදියුණු කිරීමට සහ සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම තුළින් රටට අතිරේක ආදායමක් උත්පාදනය කිරීමට රිදියගම සෆාරි උද්‍යානය ඉදිකරමින් පවතී. ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට ත්‍රාසජනක අත්දැකීම් ලබාදෙමින් ඉදිරියේදී මහජනතාවට එය විවෘත කරනු ඇත.

දැක්ම

සංරක්ෂණය, පර්යේෂණය සහ අධ්‍යාපනය සඳහා විශිෂ්ඨ මධ්‍යස්ථානය බවට පත්වෙමින් ලෝකයේ විශිෂ්ඨ සත්වෝද්‍යාන ආයතනයක් නිර්මාණය කිරීම.

සත්වෝද්‍යානයේ සතුන්ට එළවළු සහ පළතුරු නිශ්පාදනය කිරීමේ ගොවිපළක් 1977 දී හොරණ ගෝනපොළ ස්ථාපිත කර ඇත. නැවුම්, ගුණාත්මක එලවළු සහ පලතුරු වටිනා එකතුවක් සපයමින් එය ඉතා කර්යය භාර්යක් ඉටු කරයි.

ශ්‍රී ලාංකිකයින්ට භූගත මින් මැදුරක් පිළිබඳව නව අත්දැකීමක් ලබාදීමට, මෙම දෙපාර්තමේන්තුව යටතේ ගම්පහ දිස්ත්‍රිකයේ භූගත මින් මැදුරක් ඉදිකිරීමට ඉදි කිරීමට යෝජනා කර ඇත. මෙය තවම ස්ථානයක් තෝරාගැනීමේ මූලික අදියරේ පවතී.

## කර්යයය

සංරක්ෂණය. අභිජනනය සහ පර්යේෂණය. සත්ව සුභසාධනය. මහජන අධ්‍යාපනය සහ රසාස්වාදය යන මුලික පරමාර්ථ පහ මත ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව එහි කාර්යය ස්ථාපිත කර ඇත. මෙම කාර්යයන්ට අමතරව දෙපාර්තමේන්තුව රටේ අවශ්‍යතාවයන්ද ඉටුකළ යුතුව ඇත. මෙහිදී සත්වෝද්‍යාන පනතට. ආයතනික සැලැස්මට සහ රටේ අවශ්‍යතා වලට අනුකූල වන පරිදි කාර්යයන් ලැයිස්තුගත කොට ඇත.

**01. නියමිත සත්ව වාසස්ථාන සහ අදාල පහසුකම් ඉදිකිරීම.**

- අළුතින් ඉදිකරන, සත්ව අරණ හා රැඳවුම් කොටස්, බාධක හා අනෙකුත් අවශ්‍යතා ලබාදීම.
- ජලය, විදුලිය, අභ්‍යන්තර මාර්ග පද්ධතිය හා නව ගොඩනැගිලි වැනි යටිතල පහසුකම් ලබා දීම.
- අවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදු කිරීම.
- එදිනෙදා අවශ්‍යතා පරිදි නඩත්තු කටයුතු සිදු කිරීම

**02. සත්වෝද්‍යානයෙහි සතුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම.**

- ජලය, ආහාර හා අනෙකුත් අවශ්‍යතා සැපයීම.
- පශු වෛද්‍ය රැකවරණය ලබා දීම.
- සතුන්ට ඔවුන්ගේ ස්වාභාවික පරිසරයට ආසන්න වන පරිදි සත්වෝද්‍යානය තුලද එම පරිසරය ලබා දීම.
- සතුන්ට අවශ්‍ය සෞඛ්‍යාරක්ෂිත හා පිරිසිදු තත්වයන් ලබා දීම.
- චර්යාත්මක ක්‍රියාවන් ඔප් නැංවීමට අවශ්‍ය භාණ්ඩ සහ ක්‍රියාවලින් ලබා දීම.
- සහ කරුවන් හා කණ්ඩායම් අවශ්‍ය පරිදි ලබා දීම
- ඉබියතුරු, වැටවල්, සුදුසු සත්ව භාරකරුවන් හා සතුන්ට පිටස්තරයන් විසින් ආහාර දීම වැලැක්වීම, සරදම් කිරීම හා හිරිහැර සිදු කිරීම වැලැක් වීම මඟින් සතුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම

**03. වාහන ගමනාගමනය විධිමත් කිරීම හා පාලනය කිරීම.**

- නරඹන්නන්ගේ වාහන සත්වෝද්‍යානය තුලට ඇතුලත් නොකිරීම.
- සත්වෝද්‍යානය තුලට පැමිණෙන වාහන පාලනය කිරීමට, ආහාර සපයන්නන් සඳහා, කාර්යාලිය වාහන හා සේවක වාහන සඳහා වෙනම ගේට්ටු ලබා දීම.

- ආහාර බෙදා හැරීමට හා කසල එකතු කිරීමට කාල සටහන් ලබා දීම.
- සත්වෝද්‍යානය ඇතුලත වේගසීමා ලබා දීම
- සත්වෝද්‍යානය ඇතුලත බයිසිකල් ධාවනය පාලනය කිරීම.

**04. වාහන නැවැත්වීම සඳහා විශේෂ පහසුකම් ලබාදීම.**

- සේවක වාහන ලබාදීම සඳහා ස්ථාන ලබාදීම.
- කාර්යාලීය වාහන සඳහා කුඩා රථගාලක් ලබාදීම
- සැපයුම් කරුවන්ගේ වාහන සඳහා ගබඩාව ආසන්නයෙහි ප්‍රදේශයක් සැපයීම
- ආබාධිත නරඹන්නන් සඳහා රථ ගාල් කිරීමේ පහසුකම් ලබාදීම

**05. සත්වෝද්‍යානය බැලීමට පැමිණෙන නරඹන්නන්ගේ ආරක්‍ෂාව තහවුරු කිරීම**

- සතුන් හා නරඹන්නන් අතර ඍජු සම්බන්ධය වැලැක්වීම, සත්ව අරණ සඳහා බාධක, වැටවල් හා බැමි යෙදීම මඟින් තහවුරු වේ.
- ආරක්‍ෂක නිලධාරීන්ගේ සහය ලබා ගැනීම
- හදිසි සත්ව නිදහස් වීමක දී අනතුරු සිදුවීම අවම කර ගැනීමට හදිසි සැලැස්මක් තබා ගැනීම
- විවිධ ව්‍යාධි රෝග වලක්වා ගැනීම සඳහා අවශ්‍ය පියවරයන් ගැනීම.

**06. සත්වඋද්‍යානයට පිටතින් පවාත්වා ගෙන යනු ලබන ගොවිපලක් හා එහි නිෂ්පාදන සුරැකීම.**

- **ගෝනපල ගොවිපල**
- පළතුරු, එළවළු, කොළ අතු හා තණකොළ වගා කිරීම.
- සත්වෝද්‍යනයේ අවශ්‍යතාවය අනුව අස්වැන්න නෙලීම හා ප්‍රවාහනය

**07. මහජනතාව සඳහා අධ්‍යාපනය ලබා දීම.**

- විශ්ව විද්‍යාල හා පාසැල් සිසුන් සඳහා අදාල අධ්‍යපනික කටයුතු වලදි සහයෝගය ලබා දීම.
- ඉල්ලීම් මත දේශන පැවැත්වීම.
- සතුන් සඳහා නාම පුවරු හා විස්තර පුවරු ලබා දීම.
- ප්‍රකාශන සකස් කිරීම.
- අධ්‍යාපන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- මාර්ගෝපදේශ වැඩසටහන් පැවැත්වීම.
- ප්‍රදර්ශන පැවැත්වීම.

**08. නරඹනන්ට පහසුකම් සැපයීම.**

- වැසිකිළි පද්ධති පවත්වාගෙන යාම
- අවන්හල් හා කුඩා වෙලඳ කුටි පවත්වාගෙන යාම.
- සුවපහසු අභ්‍යන්තර මාර්ග පද්ධතියක් ලබා දීම.
- ප්‍රවේශ පත්‍ර ලබා දීමේ පහසු ක්‍රමයක් සැපයීම.
- සෙවන සහිත ස්ථාන, ආසන්න, පහසුකම් ආදිය සැපයීම
- සත්වෝද්‍යානය තුළ සෑම ස්ථානයක්ම මනාව ශුද්ධ පවිත්‍රව පවත්වා ගැනිම.
- කුඩා ළමුන් සඳහා මළුවක් පවත්වාගෙන යාම.
- නරඹන්නන් සඳහා අදාල තොරතුරු ලබා දීම.
- සමරු හා තෑගි භාණ්ඩ අලෙවිසැල් පවත්වාගෙන යාම
- ස්වේච්ජා සේවාවන් ලබා දීමට පහසු කම් සැපයීම

**09. පශු වෛද්‍ය ආරක්‍ෂාව ලබාදීම**

- රෝගී සතුන් සඳහා ප්‍රතිකාර කිරීම
- අවශ්‍ය ඖෂධ හා පශු වෛද්‍යමය උපකරණ මිලදී ගැනීම.
- සතුන්ගේ පශ්චාත් මරණ පරීක්‍ෂණ පැවැත්වීම.
- උසාවි නියෝග සඳහා අදාල පශු වෛද්‍ය තොරතුරු ලබා දීම.
- පශු වෛද්‍ය පර්යේෂණ පැවැත්වීම.
- බාහිර අවශ්‍යතා මත නිර්වින්දන කාණ්ඩායම සැපයීම

**10. සංරක්‍ෂණ හා අභිජනන වැඩසටහන් පැවැත්වීම.**

- මනා දත්ත ගබඩාවක් පවත්වා ගැනීම
- තෝරාගත් සතුන් සඳහා අභිජනන වැඩ සටහන් පැවැත්වීම.
- අභිජනන හා සංරක්‍ෂණය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම.
- ස්ථානීය සංරක්‍ෂණය සඳහා අවශ්‍ය කටයුතු කිරීම

**11. නරඹනන් සඳහා විනෝදාස්වාදය සැපයීම.**

- සතුන්ගේ හැකියාවන් දැක්වෙන වැඩසටහන් පැවැත්වීම.
- සතුන්ට පිට යෑමේ අවස්ථාව සැලසීම.
- උපන්දිනසාද හා උත්සව සඳහා පහසුකම් සැපයීම.
- චිත්‍රපටි, විඩියෝ, ජයාරූප අදිය සඳහා අවස්ථාව ලබා දීම.

**12. ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වාගැනීම**

- සත්වෝද්‍යාන ක්ෂේත්‍රයට අදාලව විවිධ ජාත්‍යන්තර සංවිධාන වල සමාජිකත්වය ගෙන ක්‍රියා කිරීම
- අනෙකුත් සත්වෝද්‍යාන සමඟ සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම
- සත්ව හුවමාරු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය සත්ව ප්‍රධානය කිරීම් සඳහා දායක වීම.
- නුතන සංකල්ප හා තාක්ෂණයන් හුවමාරු කර ගැනීම.

**13. ගස් හා පැල නඩත්තු කරමින් මනබදිනා උද්‍යානයක් පවත්වාගෙන යාම**

- ගස් හා පැල නඩත්තු කිරීම.
- ගස්වල අනවශ්‍ය අතු කප්පාදු කරමින් නඩත්තු කිරීම
- පවිත්‍රතාවය පවත්වාගෙනයාම
- අපද්‍රව්‍ය එකතු කිරීම හා විනාශ කිරීම
- විල් පොකුණු අදිය මනාව නඩත්තු කිරීම.

**14. විවිධ විශේෂාංග හා දිනයන්**

- විශේෂාංග හා දිනයන් සැමරීම සඳහා පහසුකම් සලසා දීම.

**15. මිලදී ගැනීම**

- සත්ව ආහාර, ඖෂධ හා අනෙකුත් අවශ්‍ය දෑ මිලදී ගැනීම
- ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීම.
- සේවක මහතුන් සඳහා නිල ඇදුම් හා ආරක්‍ෂක උපකරණ ලබාදීම.

**<u>මුලිකත්වය ලබා දෙන කාර්යයන්</u>**

උසස් තත්වයක් කරා ගෙන ඒමෙදී සමහර කාර්යයන් සඳහා මුලිකත්වය දී කලයුතු කටයුතු හඳුනා ගෙන ඇත.

**01. සත්ව සෞඛ්‍ය**

අළුතින් ඉදි කරන ලද තුන්මහල් ගොඩ නැගිල්ලෙහි පැටව් ඇති කිරීමේ මධ්‍යස්ථානය ස්ථාපිත කරණ ලද අතර එය මව් සතුන් විසින් බැහැර කරන ලද අළුතින් උපන් සතුන්ගේ මනා සෞඛ්‍ය තත්වය තහවුරු කිරීමටත් භාවිතා වේ. ගොඩනැගිල්ලේහි කොටසක අන්තරාසර්ග විද්‍යාව, අධිකරණ පශු වෛද්‍ය, ක්ෂුද්‍රජීව විද්‍යාව අදි රාසයනාගාරයන් ස්ථාපිත කර ඇති අතර එමඟින් අව්‍යාධිරෝග හඳුනා ගැනීම හා ප්‍රජනනය විද්‍යානුකූලව හැදෑරීමට හැකියාව ලැබේ.

**02. කුඩු හා අරණ**

දෙහිවල සත්වෝද්‍යානයේ ප්‍රධාන සැලැස්මට අනුව ඉදිකිරීම් සිදු කෙරෙන නූතන සංකල්ප වලට අනුව සතුන් සඳහා වැඩි ඉඩකඩක් සැපෙයෙන සත්ව අරණයන් ඉදිකරමින් පවතින අතර, ඊට සමඟාමීව නව සත්වෝද්‍යාන හා සෆාරි උද්‍යානය ඉදිවෙමින් පවති.

උදා :- දෙහිවල සත්වෝද්‍යානයේ ඉදිවෙන නව රයිනෝ අරණ.
දැනට රයිනො සතුන් කුඩා අරණකට කොටුකර ඇති අතර ඔවුන්ගේ පශ්චාත් අලිංගන ආක්‍රමණිකත්වය නිසා ඔවුනු අතර සංසර්ග අවස්ථාවන් සීමා කර ඇත. යුතු බැවින් නව රයිනෝ අරණක් ගොඩනැගෙමින් පවති

**03. මානව සම්පත් කාර්යයන්**

සත්වෝද්‍යානෙන් මානව සම්පත් දියුණු කිරීම ඉතා වැදගත් බව දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගෙන ඇත.

උදා :-

- පශු වෛද්‍යවරුන් සඳහා පුහුණු වැඩ සටහනක් ලෝක සත්වෝද්‍යාන හා මින්මැදුරු සංගමය (WAZA) සහයොගයෙන් පවත්වන ලදි.

- තවද අලි බලන්නන් පුහුණු කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදි.

**04. නරඹන්නන්ගේ පහසුකම්**

ප්‍රධාන සැලැස්ම හා නව ව්‍යාපෘති සමඟ නරඹන්නන්ගේ පහසුකම් නවීකරණය වෙමින් පවති. මේ වන විට නවීන වැසිකිළි සංකීර්ණය ආබාදිත පුද්ගලයින්ට පරිහරණය කිරීමට සුදුසු

ප්‍රමිතියෙන් යුක්තව අභ්‍යන්තර මාර්ග නවීකරණය කිරීම දෙහිවල සත්වෝද්‍යානය තුළ ආරම්භ කර ඇත.

උදා :

1. මාර්ග

බොහොමයක් මාර්ග බෑවුම් සහිත වූ බැවින් ආබාදිත පුද්ගලයින්ට පරිහරණය කිරීමට සුදුසු ප්‍රමිතියෙන් යුක්ත නොවීය. ඒ මත මූලික අවධානය යොමු කොට නිවැරදි ප්‍රමිතියෙන් යුතුව ඉදිකිරීම් ආරම්භ කර ඇත.


2. ප්‍රධාන ආපන ශාලාව

ප්‍රධාන ආපනශාලාව ක්‍රමයෙන් අභාවයට පත්වූ බැවින් රු. මිලියන 25ක් යොදවමින් නවීකරණය කරන ලදී.

## දෙපාර්තමේන්තුව යටතේ ඇති ඒකක

01. දෙහිවල සත්වෝද්‍යානය, දෙහිවල
02. පින්නවල අලි අනාථාගාරය, රඹුක්කන.
03. පින්නවල ෂත්වෝදනනය, රඹුක්කන.
04. සෆාරි උද්‍යානය, රිදියගම.
05. සත්වෝද්‍යාන ගොවිපොල, ගෝනපොල
06. නව භූගතජල මින්මැදුර, ගම්පහ.

# සංවිධාන සටහන


ORGANIZATION CHART
DIRECTOR
DD(F)
DD(G)
AO
AD(AQ)
VS(D)
AD(G)
AD(P)
VS(P)
AD(W)
AD(BA/AA)
E&RA
PAD
SH
STO.
E.D
AQ
MA/D
G.F
HO(D)
TR
A.S
S.S
GA
AS
GS
SS
OFF
HO(P)

## සේවක සුචිය

| වර්ගය | අනුමත ප්‍රමාණය | සත්‍ය ප්‍රමාණය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 17 | 14 |
| තෘතියික මට්ටම | 02 | 01 |
| ද්විතියික මිට්ටම | 122 | 91 |
| ප්‍රාථමික මට්ටම | 286 | 260 |
| කොන්ත්‍රාත් පදනමේ කම්කරුවන් | 65 | 37 |
| තත්කාර්ය කම්කරුවන් | - | 75 |
| **එකතුව** | **492** | **478** |

**2010 දෙසැම්බර් 31 වන දිනට සේවක ප්‍රමාණය**

| තනතුරු නාමය | අනුමත ප්‍රමාණය | සත්‍ය ප්‍රමාණය |
|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | |
| අධ්‍යක්ෂ | 01 | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) | 01 | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (වාගොල්ල) | 01 | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පොදු) | 01 | 01 |
| සහකාර අධ්‍යක්ෂ (පොදු) | 01 | 01 |
| සහකාර අධ්‍යක්ෂ (මින්මැදුර සහ පර්යේෂණ) | 01 | 01 |
| සහකාර අධ්‍යක්ෂ | 02 | 01 |
| පශු වෛද්‍ය | 08 | 08 |
| **එකතුව** | **17** | **14** |
| **තෘතියික මට්ටම** | | |
| පරිපාලන නිලධාරි (දෙහිවල) | 01 | 01 |
| පරිපාලන නිලධාරි (පින්නවල) | 01 | - |
| **එකතුව** | **02** | **01** |

| තනතුරු නාමය | අනුමත ප්‍රමාණය | සත්‍ය ප්‍රමාණය |
|---|---|---|
| **ද්විතියික මට්ටම** | | |
| අධ්‍යාපන නිලධාරී | 01 | 01 |
| අධ්‍යාපන සහ පර්යේෂණ සහතාර | 31 | 17 |
| අයවැය සහකාර | 01 | 01 |
| මූල්‍ය සහකාර | 04 | 01 |
| පරීක්ෂණාගාර ශිල්පි | 01 | - |
| ජ්‍යෙෂ්ඨ ආරක්ෂක (සත්ව) | 01 | - |
| පාලක (උද්‍යාන | 01 | - |
| පාලක (නඩත්තු) | 01 | - |
| පාලක (සත්ව) | 03 | 02 |
| පාලක (මීන්මැදුර) | 01 | 01 |
| පාලක (උරගළුයන) | 01 | - |
| සැලසුම් නිලධාරී | 01 | - |
| මහජන කළමණාකරණ සහකාර | 29 | 20 |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | 01 | - |
| ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරී | 01 | - |
| ආරක්ෂක නිලධාරී (පිරිමි) | 26 | 24 |
| ආරක්ෂක නිලධාරී (ගැහැණු) | 05 | 04 |
| සහකාර පාලක (සත්ව) | 07 | 05 |
| චිත්‍ර ශිල්පි | 02 | 02 |
| පිළිගැනීමේ නිලධාරී | 01 | 01 |
| ගබඩා සහ සැපයුම් නිලධාරී | 01 | - |
| සහකාර ගබඩා සහ සැපයුම් නිලධාරී | 01 | 01 |
| පරීක්ෂණාගාර සහකාර | 03 | 02 |
| **එකතුව** | **125** | **83** |
| **ප්‍රාථමික මට්ටම** | | |
| ප්‍රධාන සත්ව භාරකරු | 01 | 01 |
| ප්‍රධාන අලි බලන්නා | 02 | 01 |
| රියදුරු | 15 | 15 |
| අලි බලන්නා | 51 | 39 |
| සත්ව භාරකරු | 50 | 42 |
| මින්මැදුර උපස්ථායක | 08 | 08 |
| ආදර්ශ ද්‍රව්‍ය එකතුකරන්නා | 01 | 01 |
| අරක්කැමි | 01 | 01 |

| | | |
|---|---|---|
| සහයක අරක්කැමි | 01 | 01 |
| **තනතුරු නාමය** | **අනුමත ප්‍රමාණය** | **සත්‍ය ප්‍රමාණය** |
| පෙදරේරු | 06 | 06 |
| පැස්සුම්කරු | 02 | 02 |
| වඩුකාර්මික | 04 | 04 |
| කම්මල්කරු | 01 | 01 |
| අත්උදව්කරු | 01 | 01 |
| බෙලෙක් ඩැඩකරු | 02 | 02 |
| නළ ඩැඩකරු | 02 | 02 |
| පින්තාරුකරු | 02 | 02 |
| ඩීසල් පොම්ප ක්‍රියාකරු | 01 | 01 |
| ජල නළ කාර්මික | 01 | 01 |
| කංකානි | 04 | 03 |
| උයන්කරු | 11 | 10 |
| උයන් කම්කරු | 96 | 78 |
| අලෙවි සහයක | 01 | - |
| කාර්යාල කාර්යය සහයක | 10 | 03 |
| ගබඩාකරු | 04 | 03 |
| මුරකරු | 02 | 02 |
| ලොරි පිරිසිදුකරු | 02 | 02 |
| **එකතුව** | **283** | **232** |
| අනියම් කම්කරු | 65 | 39 |

## අත්කරගැනීම්


### නරඹන්නන්

2010 දෙසැම්බර් 31 වන විට දේශීය නරඹන්නන් 2,077,804 දෙනෙකු සහ විදේශිය නරඹන්නන් 246,557 දෙනෙකු දෙහිවල සත්වෝද්‍යානය සහ පින්නවල අලි අනාථාගාරය නරඹා ඇත. පසුගිය වසරවල වාර්තා වූ වැඩිම නරඹන්නන් සංඛ්‍යාව මෙය වේ.

2010 දෙසැම්බර් 31 වන විට නරඹන්නන්ගේ සංඛ්‍යා පහත වගුවේ දක්වා ඇත.

| නරඹන්නන් වර්ගීකරණය | දෙහිවල | පින්නවල | එකතුව |
|---|---|---|---|
| දේශිය | 1,677,775 | 400,029 | **2,077,804** |
| විදේහිය | 17,197 | 229,360 | **246,557** |
| **එකතුව** | **1,694,972** | **629,389** | **2,324,361** |


| නරඹන්නන් වර්ගීකරණය | දෙහිවල | පින්නවල |
|---|---|---|
| දේශිය වැඩිහිටි | 1,146,223 | 258,744 |
| දේශිය ළමා | 291,778 | 64,203 |
| පාසැල් ළමුන් | 239,774 | 77,082 |
| විදේශිය වැඩිහිටි | 7,887 | 180,953 |
| විදේශිය ළමා | 1,269 | 8,315 |
| සා(ර්)ක් වැඩැහිටි | 6,582 | 36,619 |
| සා(ර්)ක් ළමා | 1,459 | 3,472 |



## ආදායම 2010

ඇතුල්වීමේ ගාස්තු, සුරතල් මසුන් සහ පැලෑටි අලෙවිය, අලි පැටවුන්ට කිරි පෙවීම සඳහා ප්‍රවේශපත් අලෙවිය, පළතුරු කැවීම සඳහා ප්‍රවේශපත් අලෙවිය, පෝනි පිට යාම සඳහා ප්‍රවේශපත් අලෙවිය, අලි පිට යාම සඳහා ප්‍රවේශපත් අලෙවිය, බදු ආදායම යනාදිය මඟින් දෙහිවල සත්වෝද්‍යානය සහ අලි අනාථාගාරය විසින් රු.මි. 588ක ආදායමක් උපයා ඇත. දෙහිවල සත්වෝද්‍යානය සහ පින්නවල අලි අනාථාගාරය නැරඹීමට පැමිණෙන සංචාරකයින් මඟින් උපයාගෙන ඇති ආදායම රු.මි. 568ක් සහ අනෙකුත් මාර්ග වලින් උපයාගෙන ඇති අදායම  රු.මි. 20ක් වේ.

| දෙපාර්තමේන්තු ඒකක | ප්‍රවේශ පත්‍ර ආදායම රු.මි. | වීඩියෝ ප්‍රවේශපත්‍ර රු.මි. | අනෙකුත් ආදායම රු.මි. | මුලු ආදායම රු.මි. |
|---|---|---|---|---|
| **දෙහිවල** | 149 | 0.9 | 10 | 159.9 |
| **පින්නවල** | 419 | 4.9 | 4.3 | 428 |
| **මුලු ආදායම** | **568** | **5.8** | **14.3** | **587.9** |



# වියදම්

| සංකේත අංකය | වර්ගය | 2010 | |
|---|---|---|---|
| | | ඇස්තමේන්තුව | සත්‍ය වියදම |
| | | | |
| | **පුනරාවර්තන වියදම** | **133,939,000** | **133,306,000** |
| | පුද්ගල වැටුප් | 119,635,000 | 119,512,000 |
| | වෙනත් | 14,304,000 | 13,794,000 |
| | ප්‍රාග්ධන වියදම | 267,350,000 | 237,888,000 |
| | **පුනරාවර්තන සහ ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණුකිරීමේ වියදම** | **19,000,000** | **14,941,000** |
| | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 15,000,000 | 11,667,000 |
| **2001**<br>**2002** | කර්මාන්ත. යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 2,000,000 | 1,326,000 |
| | වාහන | 2,000,000 | 1,948,000 |
| **2003** | **ප්‍රාග්ධන වත්කම් අත්පත්කරගැනීම** | **246,750,000** | **221,871,000** |
| <br>**2101**<br>**2102**<br>**2103**<br>**2104**<br><br><br><br><br>**2105** | වාහන<br>ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ<br>කර්මාන්ත, යන්ත්‍ර සහ උපකරණ<br>ගොඩනැගිලි සහ ඉදිකිරීම්<br>අලි අනාථාගාරය<br>පින්නවල නව සත්වෝද්‍යානය<br>මින්මැදුර-වත්තල<br>සෆාරි උද්‍යානය-රිදියගම<br>වෙනත්<br>ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම් | 3,000,000<br>750,000<br>5,000,000<br>236,000,000<br>16,000,000<br>100,000,000<br><br>100,000,000<br>20,000,000<br>2,000,000 | -<br>352,000<br>4,403,000<br>217,116,000<br>6,009,000<br>99,714,000<br><br>93,806,000<br>17,586,000<br>- |
| | **ශක්‍යතා වර්ධනය** | **100,000** | **79,000** |
| | පුහුණුවීම් සහ ශබ්‍යතා වර්ධනය | 100,000 | 79,000 |
| **2401** | **අනෙකුත් ප්‍රාග්ධන වියදම්** | **1,500,000** | **997,000** |
| | අනෙකුත් ආයෝජන | 1,500,000 | 997,000 |
| **2502** | **එකතුව** | **401,289,000** | **371,194,000** |

## 2010 වර්ෂයේ ප්‍රතිලාභ වර්ධනය

## දෙහිවල සත්වෝද්‍යානයේ සංවර්ධන කටයුතු

### 1. සත්ව සුභසාධනය

සත්වෝද්‍යානයක සත්ව කූඩු වරින් වර අළුත්වැඩියා කළ යුතු වේ. සෑම වසරකදීම සත්ව කූඩුවල ගුණාත්වය වැඩිදියුණුකර තබාගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් අළුත්වැඩියා කිරීමේ වැඩසටහන් කරගෙන යයි. ඇතැම්විට නව ආනයනික සත්වයයන් සඳහා සහ සත්වයින් වෙන් කර තබාගැනීමට පහසුකම් සැපයියි යුතු බැවින් නව වාසස්ථාන ඉදිකළ යුතු වේ.

2010 වසරේදී සමහර සත්වයින් ලැඟුම් ගන්නා ස්ථාන අළුත්වැඩියා කරන ලදී. සමනල උයන සහ වඳුරු කූඩු ඒ අතර ප්‍රධාන තැනක් ගනී. වසරේ පළමු කාර්තුව තුළ චීනයෙන් ගෙන්වන ලද සුදු කොටි දෙදෙනෙකු සඳහා පවත්නා සත්ව වාසස්ථාන අළුත්වැඩියා කර ඉඩසහසුකම් ලබාදුන් අතර අනෙකුත් අළුත්වැඩියා කටයුතු වසර පුරා ක්‍රියාත්මක වෙමින් ඇත.

නිදහස් අලි අරණේ අවසන් අදියර ක්‍රියාත්මක වෙමින් ඇත. මඩු සහ මළ නල පද්ධතියේ වැඩ අවසන් කරඇති අතර වැට සහ ගේට්ටුවේ වැඩ අවසන් කිරීමට නිමිතව ඇත. මෙම වැඩ සඳහා ටෙන්ඩර් කැඳවා ඇති අතර මෙම වසරේ අගෝස්තු වන විට මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.1.5ක් වැය කොට ඇත. මේ සඳහා රු.මි.2.3ක මුදලක් වෙන්කොට ඇත.



සමනල උයනේ අළුත්වැඩියා කටයුතු



නිදහස් අලි අරණේ මඩු

## 2. අධ්‍යාපන

### සත්වෝද්‍යාන කටුගෙය

සත්ව විෂය සම්බන්ධයෙන් වඩා හොඳ අධ්‍යාපනික අත්වැලක් ලබාදීමේ මාර්ගයක් වශයෙන් සත්වෝද්‍යාන කටුගෙයක ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. පිරවීමේ සහ මැරුණු සතුන් සංරක්ෂණය කිරීමේ කටයුතු පසුගිය වසර 2ක කාලයක සිට කරගෙන යනු ලැබේ. කටුගෙයි ශීත කිරීමේ ඒකකයේ සහ ඇළුමිනියම් දොරවල් සහ පාටිෂන් කිරීමේ කටයුතු යනාදියෙහි ඉදිකිරීම් කර ඇත. මූලික පසුතිර සහ පසුතිරය නිර්මාණය සඳහා මිල ගණන් කැඳවා ඇති අතර එම කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. පසුතිර සඳහා මුහුණත ඔපදැමීමේ කටයුතු සකසා ඇත.

මඩු මාලුවා. මුහුදු රාජාලියා. ගැට කිඹුලා. තලපතා, වඳුරා. ඇතළු සතුන් පුරවා සකස්කොට ඇති අතර කැස්බෑ ඇටසැකිළිද සකස්කොට ඇත.

අගෝස්තු මස අවසන් වන විට කටුගෙය ඉදිකිරීමේ කටයුතු සඳහා රු.මි.1.5ක් වැය කොට ඇත.


කටුගෙය ඇතුළත දර්ශන


පිවිසුම් දොරටුව

## 3. සේවක සුභසාධනය

### නව සුභසාධක ආපනශාලාව

සේවක සුභසාධනය වැඩිදියුණු කිරීම උදෙසා පැවති සුභසාධක ආපනශාලාව ඉවත් කරමින් පෙබරවාරි මාසයේදී නව ආපනශාලාවක ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. මෙම ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ආපනශාලාව සඳහා භාවිතා කිරීමට තාවකාලික කුඩාරමක් ඉදිකරන ලදී.



සුභසාධක ආපනශාලාවේ ඉදිකිරීම් කටයුතු

### 4. ප්‍රධාන සැලැස්ම

දෙහිවල සත්වෝද්‍යානයේ ප්‍රධාන සැලැස්ම අදියර 2කින් ක්‍රියාක්මක කිරීමට යෝජිතය. සමහර ඉදිකිරීම් සහ අළුත්වැඩියා කිරීම් ඉක්මණින් කළ යුතු බවට හඳුනාගෙන ඇති අතර ප්‍රථම අදියර 2010 වසර අවසානයේදී ආරම්භ කරන ලදී.

- පැටවී ඇති කිරීමේ මධ්‍යස්ථානය
- මාර්ග 4ක්
- භූගත ජල ටැංකිය
- හංස පොකුණේ පැති බැම්
- නිල නිවාස 2ක්
- තාප්පය සහ චේන්ලින්ක් වැට

ප්‍රධාන සැලැස්මෙහි අනෙකුත් අළුත්වැඩියා සහ ඉදිකිරීම් සම්බන්ධයෙන් රජයේ නියෝජිත ආයතන වලින් 2010 අගෝස්තු වන විට සැලසුම් සහ මිල ගණන් කැඳවා ඇති අතර 2011 වර්ෂයේදී ඉදිකිරීමට අපේක්ෂිතය.

## 5. නව පැමිණීම්

සත්වෝද්‍යානය සත්ව හුවමාරු වැඩසටහන යටතේ නව සතුන් සහ තනි සතුන් සඳහා සහකරුවන් ලබාගත් අතර එය නව උපත් ඇතිවීම සඳහා අවස්ථාවක් සපයනු ඇත.

1. චින්පන්සි එක් අයෙකු ටොකියු වඳුරන් දෙදෙනෙකු සහ සිල්වර් ලීෆ් වඳුරන් දෙදෙනෙකු ලබාදීමෙන් චීනයෙන් සුදු කොටි දෙදෙනෙකු ලබාගන්නා ලදී.

2. තිත් සහිත කැලෑ බළලන් එක් අයෙකු සහ සහ දඹු ලේනන් දෙදෙනෙකු ලබාදීමෙන් මුදු වලිගය සහිත ලිමර් සතුන් දෙදෙනෙකු මියර්කැට්ස් සතුන් දෙදෙනෙකු එක්සත් රාජධානියෙන් ලබාගන්නා ලදී.

සත්ව හුවමාරු වැඩසටහන සඳහා රු.මි. 1ක් මෙම වසර තුළ වෙන්කර ඇති අතර රු.මි. 0.3ක් අගෝස්තු මස වන විට වැය කර ඇත. මූල්‍ය ප්‍රගතිය 30% කි.



මුදු වලිගය සහිත ලිමර්



සුදු කොටි

| දෙහිවල සත්වෝද්‍යානයේ සතුන් | | | |
|---|---|---|---|
| # | වර්ගය | විශේෂ | ප්‍රමාණය |
| [1] | ක්ෂීරපායි | 100 | 450 |
| [2] | කුරුල්ලන් | 110 | 1000-1500 |
| [3] | මත්ස්‍ය | 65 | 1000 |
| [4] | උරග | 34 | 250 |
| [5] | උභයජීවී | 3 | 20 |
| [6] | සමනල | 30 | 100 |
| [7] | Marine Invertebrates | 10 | 25 |

**පින්නවල අලි අනාථාගාරයේ ඉදිකිරීම්**

**1) සුභසාධක ආපනශාලාවේ සෝකේජ් සවිකිරීමට**

පින්නවල අලි අනාථාගාරයේ සේවකයන් විසින් නව පෙඟවුම්වලක් හාරා (soakage pit) සකසන ලදී. මෙය නිම කිරීම සඳහා දරණ ලද මළු වියදම රු. 30950.00 ක් විය.

**2) ආරක්ෂක කුටිය සංවර්ධනය කිරීම.**

වැඩි ඉඩ ප්‍රමාණයක් ලබාගැනීමේ අරමුණින් වේ පාලම (weighbridge) අසල ආරක්ෂක මුරකුටිය විශාල කිරීම. ඉදිකිරීම් කටයුතු වලින් 60% ක් අවසන්කර ඇති අතර දරන ලද වියදම රු. 38770.00කි.

**3) පිවිසුම් ගොඩනැගිල්ල අසල බිම් ඇතිරුම් ගල් ඇල්ලීම සහ කාණු ඉදිකිරීම.**

ප්‍රධාන පිවිසුම සහ රඹුක්කන කෑගල්ල ප්‍රධාන පාර අතර අඩිපාර බිම් ඇතිරුම් ගල් යොදා ඉදිකිරීම සහ පාර දෙපස කාණු ඉදිකිරීම.



පිවිසුම අසල



ප්‍රධාන පිවිසුම අසල බිම් සැකැස්ම

**4) "අවන්හල" සංචාරක හෝටලය අසල පෙඟවුම්වල ඉදිකිරීම.**

අලි අනාථාගාරයේ සංචාරක හෝටලය අසල කොන්ත්‍රාත්කරුවන් විසින් පෙඟවුම්වලක් ඉදිකරන ලද අතර දරන ලද වියදම රු.233000.00 කි.

**5) පිවිසුම් ශාලාව වටා උද්‍යානයෙහි බිම් සැකැස්ම**

විවිධ වර්ගයේ අලංකාර පැලෑටි වර්ග සහ පළතුරු ගස් යොදාගනිමින් උද්‍යානයෙහි බිම් සැකැස්ම කර ඇත.

**පින්නවල අලි අනාථාගාරයේ වර්ධනය (2010 අවසාන වන විට)**

| | | |
|---|---|---|
| 01. | නව ප්‍රවේශ ශාලාව<br>• විදුලිබලය සැපයීම (භූගත රැහැන් ඇදීම - ඇගයීම සඳහා තාක්ෂණික කමිටුවක් පත් කරන ලදී)<br>• Handing over stalls (පාර්ටිෂන් කිරීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ප්‍රධානය කරන ලදී) | 95% |
| 02. | පිවිසුම් ශාලාව වටා උද්‍යානයේ ඉදිකිරීම් සම්පූර්ණ කිරීම | 95% |
| 03. | කම්කරුවන් සඳහා තට්ටු සහිත විවේකාගාර 2ක් ඉදිකිරීම | 02% |
| 04. | නිදහස් නැරඹුම් භූමියක් ඉදිකිරීම | 30% |
| 05. | "අවන්හල" සඳහා සුහසාධක ආපනශාලාව සහ වැව්කිළි වල අසල ජලය බැසයන වලක් ඉදිකිරීම | 100% |
| 06. | අංක 05 උද්‍යානයේ ඉදිකිරීම් සම්පූර්ණ කිරීම | 35% |
| 07. | "අලි පන්ති" අළුත්වැඩියා කිරීම සහ ඉදිකිරීම | 10% |
| 08. | අභ්‍යන්තර මාර්ග අළුත්වැඩියා කිරීම | 15% |
| 09. | කුඩා ප්‍රමාණයේ පස් කපන යන්ත්‍ර මිලදී ගැනීම | 05% |

## අධ්‍යාපන අංශය

### දෙහිවල සත්වෝද්‍යානය

දෙහිවල සත්වෝද්‍යානය විසින් පාසැල් ව්‍යාපෘති 289 ක් මෙහෙයවා ඇති අතර රටෙහි විවිධ අංශ ඔස්සේ පවත්වනු ලබන ප්‍රදර්ශන 15ක් සඳහා සහභාගිත්වය ලබා දී ඇත.

රජරට, වයඹ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සඳහා මෙන්ම ලලිත් ඇතුලත්මුදලි වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය සහ දේශීය වෛද්‍ය ආයතනය යන ආයතන වල සිසුන් සඳහාද ජෛව විවිධත්වය මත පදනම් වූ විසකුරු සර්පයින්, සමනලයින්, කූඩුවල දමන ලද කුරුල්ලන්, කිඹුලන් යනාදි අංශ සම්බන්ධයෙන් දේශන පවත්වන ලදී.

කුරුල්ලන්, බළල් පවුලේ සමාජිකයන්, උරගයින්, මුහුදු සිංහයින් සහ අලින් සම්බන්ධයෙන් අධ්‍යාපනික විස්තර ප්‍රකාශන මාලාවක් මෙයෙවමින් සිටියි. විස්තර සහිත නව පුවරු 15 ක් ප්‍රහර්ශනය කිරීමටද කටයුතු යොදා ඇත.

දෙපාර්තමේන්තුවේ නීති හා කොන්දේසි වලට යටත්ව විදේශීය ස්වේච්ඡා පුහුණුවන්නන්ගේ ඉල්ලීම මත දෙපාර්තමේන්තුව ස්වේච්ඡා පුහුණු වැඩසටහන් පවත්වයි. සැලකිය යුතු අයකීමක් යටතේ මෙම වැඩසටහන මෙහෙයවනු ලබන අතර පුහුණුව සම්පූර්ණ කිරීමේදී සහතිකයක් නිකුත්කරයි.

### පින්නවල අලි අනාථාගාරය

උසස්පෙළ සිසුන් සඳහා ව්‍යාපාති 47ක් සහ විශ්ව විද්‍යාල සිසුන් සඳහා ව්‍යාපෘති 10ක් පින්නවල අලි අනාථාගාරය විසින් මෙහයවා ඇති අතර අලි සංරක්ෂණය සම්බන්ධයෙන් පැසැල් සසුන් සඳහා දේශන 880ක් සහ විශ්ව විද්‍යාල සිසුන් සඳහා දේශන 60ක් මෙහෙයවා ඇත. 2010 පරසර දිනය වෙනුවෙන් විශේෂ අධ්‍යපනික වැඩසටහනක් මෙහෙයවා ඇත.

## පින්නවල නව සත්වෝද්‍යානය

පින්නවල නව සත්වෝද්‍යානයේ ප්‍රතම අදියර 2010 නොවැම්බර් 17 විවෘත කිරීමට සැලසුම් කර ඇත. තෝරාගන්නා ලද සත්ව වාසස්ථාන ඉදි කිරීම සහ යටිතල පහසුකම් සැපයීම ක්‍රියාත්මක වෙමින් පවතී.

සත්වෝද්‍යානෙය වටා චේන් ලින්ක් වැට හා ආශ්‍රිත වැඩ සම්පූර්ණ කර ඇත. ඉඩම් අත්පත්කර ගත යතු බැවින් සත්වෝද්‍යානයේ මායිම් තාප්පයේ පිටුපස කොටස තවම ඉදිකොට නැත. ඉඩම් අත්පත් කරගැනිම ක්‍රියාත්මක වෙමින් පවතී. ඉන්පසු ඉතිරි වැඩ ආරම්භ කරනු ලැබේ.



චේන් ලින්ක් වැට සහ තාප්පය



වතුර ටැංකිය

වතුර ටැංකි 2ක වැඩ මෙම වර්ෂය තුළ සම්පූර්ණ කර ඇත. ජල ටැංකියේ ධාරිතාවය ලිටර් 227000 ක් ($227m^3$) සහ භූගත පොම්පාගාරයේ ගබඩාකිරීමේ ධාරිතාවය ලිටර 1362000 ක් ($1362m^3$) වේ.

පින්නවල සත්වෝද්‍යානයේ මාර්ග ජාල 2ක් ඇත. අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගය සමස්ථ සත්වෝද්‍යානයේ දිගින් කි.මී. 03 ක් ආවරණය වේ. මෙම මාර්ගය DBST (Double Bitumen Surface treatment) මාර්ගයක් වශයෙන් ඉදිවේ.



අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගය

ගබඩා හා සැපයුම් ගොඩනැගිලි සහ පෝෂණ සහ සත්ව ආහාර සැකසීමේ ගොඩනැගිලි ඉදිකරමින් පවතින අතර මූලික වැඩ සිදුකරමින් පවතී.

දැනට තෝරාගන්නා ලද සත්ව අරණ වල වැඩ කරගෙන යනු ලැබේ. මෙම වර්ෂය සඳහා රු.මි.120ක් වෙන්කර ඇති අතර අගෝස්තු 31 වන විට රු.මි. 80.8 ක් යොදවා ඇත. මූල්‍ය ප්‍රගතිය 67% කි.



සත්ව වාසස්ථාන ඉදිකරමින්



ගබඩා හා සැපයුම් ගොඩනැගිල

## සෆාරි පාක්, රිදියගම, හම්බන්තොට

සෆාරි පාක්හි ඉදිකිරීම් වැඩ 2008 වර්ෂයේ දෙසැම්බර් 20 ආරම්භ කරන ලදී. අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙහි වැඩ කටයුතු 2009 සැප්තැම්බර් මස වන තුරු ප්‍රමාද විය. මේ අතරතුර අවශ්‍ය මැනීම් කටුතු, නිර්මාණ කටයුතු, දළ සටහන සහ ටෙන්ඩර් ලියකියවිලි වල කටයුතු සිදුකරන ලදී.

උද්‍යානය වටා විදුලි වැට ගොඩනඟා ඇත. පිටත තාප්පය සහ චේන් ලින්ක් වැට, ඇතුළත තාප්පය සහ චේන් ලින්ක් වැට, සිංහ වාසස්ථානය, මාර්ග සහ නිල නිවාස දෙකක් ඉදකිරීමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සම්බන්ධ වී ඇත. පිටත සීමා තාප්පයෙන් මීටර් 626 ක් සහ ඇතුළත සිංහ සෆාරි කලාපයේ සීමා තාප්පයෙන් මීටර් 1300 ක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සම්පූර්ණ කර ඇත. සිංහ ගුහාව - අත්තිවාරම් දැමීමේ කටයුතු 80% ක් සම්පූර්ණ කර ඇත. සුලු සේවක සහ නිලධාරීන් සඳහා වන නිල නිවාස - 100% සම්පූර්ණ කර ඇත. සිංහ කලාපයේ මාර්ගය - එළි පෙහෙළි කිරීම් 100% සහ පස් ඉවත් කිරීම් 10% සම්පූර්ණ කර ඇත. සිංහ කලාපයේ සේවා සැපයීමට ඉදිකර ඇති මාර්ගය සලකුණු කිරීම 100% සහ එළිපෙහෙළි කිරීම 90% සම්පූර්ණ කර ඇත. නිරෝධායන කුඩු - අත්තිවාරම් දැමීමේ කටයුතු 95% සම්පූර්ණ කර ඇත. සත්ව රෝහල - සලකුණු කිරීම සහ කැණීම් 100% සම්පූර්ණ කර ඇති අතර ඒ කොටසේ අතුරු ඉදිකිරීම් 30% සම්පූර්ණ කර ඇත.

සිංහයන් රදවා තැබීමට වෙන්කර ඇති ප්‍රදේශයේ ඇති කුඩා ජල ටැංකිය ඉදිකිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව සම්බන්ධ වී ඇති අතර වලවේ ගඟෙන් ජලය ලබාගැනිම සඳහා නළ ළිං 4ක් ජාතික ජල සම්පාදන සහ ජලප්‍රවාහන මණ්ඩලය මඟින් ඉදිකර ඇත. ඔවුන් මෙ වන විට ජලය බෙදාහැරීමේ සහ පොම්ප කිරීමේ පද්ධතිය සැකසීමට සම්බන්ධ වී ඇත. උද්‍යානය සඳහා විදුලිය සැපයීම විදුලිබල මණ්ඩලයෙන් ලබාගැනීමට සහ පොම්පාගාරයට අනෙකුත් තොග සැපයුම් කිරීමටද අවශ්‍ය කටයුතු යොදා ඇත.

මෙම ව්‍යපෘතිය සඳහා සමස්ථ ඇස්තමේන්තු පිරිවැය රු.මි. 1600ක් සහ මෙම වසර සඳහා රු.මි. 140 ක් වෙන්කර ඇත. 2010 දෙසැම්බර් 31 දිනට වියදම රු.මි. 137ක් සහ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය 98% කි.



පිටත චේන් ලින්ක් වැට ඉදිකරමින්



නිරෝධායන කුඩු





මධ්‍ය පංතියේ නිල නිවාස

කනිෂ්ඨ පංතියේ නිල නිවාස



සත්ව රෝහල

NATIONAL
ZOO
SRI LANKA

**ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව**
**අනගාරික ධර්මපාල මාවත,**
**දෙහිවල.**
**0112712752- 3**
Zoosl.slt.lk